රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක. 50/90 (III)

මගේ අංකය:II/IIII ඊ44, (V)
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07,

1992 සැප්තැම්බර් මස 25 වැනි දින.

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්,
දිසාපතිවරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
ආණ්ඩුකාරවරුන්ගේ ලේකම්වරුන් වෙත.

**රජයේ සේවකයින් හා විශ්‍රාමිකයින් වෙත අතිරේක දීමනාවක් ගෙවීම.**

90.11.29 දිනැති අංක. 50/90, 91.12.25 දිනැති අංක.50/90 (1) සහ 92.03.26 දිනැති අංක. 50/90 (II) දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවලට අමතරවයි.

02. 63/89 හා 89.12.27 දිනැති රාජ්‍ය පරිපාලන, චක්‍රලේඛය අනුව රු.200/=ක මාසික දීමනාව හෝ අංක. 50/90 හා 90.11.29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව රු.300/= ක මාසික දීමනාව හෝ යම් නිලධාරියෙකු ලබමින් සිටියේ නම් / ඒ සඳහා හිමිකම් ලබන්නේ නම්, උසස්වීම් ලැබීම නිසා ඔහුගේ වැටුප් වෙනස් වුව ද එම නිලධාරියාට පෞද්ගලික වන සේ එම දීමනාව නොවෙනස්ව ලබා ගැනීමට ඔහුට ඉඩ දිය යුතු යයි තීරණය කර ඇත.

03. යම් නිලධාරියෙකු ලබමින් සිටි දීමනාවේ වෙනසක් කර ඇත්නම්, එම හිමිකම 1991.12.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි යථාවත් කළ යුතුය.

04. 1992.01.09 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක.01/92 හි සඳහන් රු. 100/= දීමනාව ලබාගැනීමට රු.3000/= හෝ ඊට අඩු ඒකාබද්ධ මාසික ආරම්භක වැටුපකින් යුත් වැටුප් පරිමාණයක සිටින රාජ්‍ය / පළාත් පාලන සේවකයන්ට හිමිකම් ඇත. විශ්‍රාමිකයන්ට ද, ඔවුන්ගේ අඩු නොකළ විශ්‍රාම වැටුප් රු. 3000/= ක් හෝ ඊට අඩු නම් මෙම දීමනාව ගෙවිය යුතුය.

05. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිව නිකුත් කරන ලදී.

අ.කලේ/ (එම්.එන්.ජුනයිඩ්),
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.